**<u>අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී තනතුර</u>**

2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මගින් පිහිටුවා ඇති එම කාර්යාලයේ පුරප්පාඩුව පවතින මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී තනතුර සඳහා ද්විතීයන පදනම මත නිලධාරියකු බඳවා ගැනීමට අවශ්‍යව ඇති බව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOJ/E08(III)/OMP/ADMIN.OFFICER/2023 iii වෙළුම හා 2023.07.27 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

02. ඒ අනුව එම තනතුර සඳහා තාවකාලික පදනමින් පත්වීමට කැමති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I / II ශ්‍රේණියේ නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මඟින් ඉල්ලීමක් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වමි.

03. බඳවා ගැනීමේ පටිපාටියට අනුව විස්තර ඇමුණුම 01 ලෙස දක්වා ඇති අතර තවදුරටත් සවිස්තරාත්මක තොරතුරු පහත සඳහන් දුරකථන අංකය ඇමතීම මඟින් ලබාගත හැකිය.

**නයෝමි වීරසිංහ මිය – 0112 861 431**
**පරිපාලන නිලධාරී - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**

පී.ඩබ්ලිව්.රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයයේ ලේකම් වෙනුවට

දුරකතන : 011-2696211-13 (දිගුව 132/218) / 011-2698672
ෆැක්ස් : 0112693304
විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com

## The Post of Head of Finance and Procurement in the Office on Missing Persons

It has been informed by the letter of Secretary, Ministry of Justice, Prison Affairs and Constitutional Reforms No: MOJ/E08(III)/OMP/ADMIN.OFFICER/2023 iii වෙළුම dated 27.07.2023 that it is required to recruit an officer on secondment basis for the post of Head of Finance and Procurement, which remains vacant at the Office on Missing Persons established by the Office on Missing Persons (Establishment, administration and discharge of functions) Act No: 14 of 2016.

02. Accordingly, the officers in Grade I/II of the Sri Lanka Accountants' Service who wish to be appointed for the said post on temporary basis are kindly informed to make a request to the Secretary of the Ministry of Justice, Prison Affairs and Constitutional Reforms through the respective Head of Institution.

03. The details are given in Annex 01 as per the recruitment procedure and further details can be obtained by contacting the following officer.

**Mrs. Nayomi Weerasinghe - 0112 861 431**
**Administrative Officer - Office on Missing Persons**


P.W. Rajapaksha
Additional Secretary (Public Administration)
For Secretary
Ministry of Public Administration, Home Affairs,
Provincial Councils and Local Government

Telephone: 011-2696211-13 (Ext. 132/218) / 011-2698672
Fax: 0112693304
E-mail address: d.acsd.pubad@gmail.com

අමුණුම 01

<u>බඳවා ගැනීමේ පටිපාටියට අනුව</u>

<u>මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී සඳහා සුදුසුකම්</u>

**රැකියා ස්වභාවය :** වාර්ෂික අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක හි සියලුම මූල්‍ය ක්‍රියාකාරීත්වය අධීක්ෂණය සහ අදාළ අමාත්‍යාංශ අධිකාරී සහ අදාළ අමාත්‍යාංශ, අධිකාරී සහ අදාළ ආයතන සමඟ කටයුතු කිරීම සඳහා වගකීම දරයි.

**සුදුසුකම්** : 1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණ/මූල්‍ය/ව්‍යාපාර පරිපාලන /වානිජ්‍ය ක්ෂේත්‍රයක උපාධියක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය

සහ

රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 13ක කළමණාකරණ මට්ටමේ පළපුරුද්ද

2. පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**කේතය හා**
**වැටුප් පරිමාණය** : HM 1-1 (රු. 80,295 – 15x 2,270 – 114,345/-)